**ලිට්රෝ ගෑස් ලංකා සමාගම - 2018**

------------------------------------------

**1.1 මතය**

------

ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

--------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු ගිණුම්

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) පිළිවෙලින් 2013 සහ 2018 වර්ෂයන්හිදී අවලංගු කරන ලද නැව් බඩු වෙනුවෙන් වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු ලෙස එල්පී ගෑස් ආනයනය කිරීමේදී රු. මිලියන 15.5 ක සහ රු. මිලියන 15.1 ක මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාගම එම මුදල නැවත අයකර ගැනීමට හිතකර ක්‍රියාමාර්ග ගෙන නොමැත. | සමාගම විසින් එම ශේෂය අය කර ගැනීම සඳහා මෙම ගැටළුව ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කර ඇත. | හිඟ මුදල් අය කර ගැනීමට සමාගම වහාම පියවර ගත යුතුය. |
| (ii) 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු බහාලුම් තැන්පතු ශේෂය රු. මිලියන 4.9 කි. ඉන් රු. මිලියන 4.55 ක් 2006 සිට 2014 දක්වා කාලය සඳහා අදාළ වේ. කෙසේ වුවද, එම හිඟ ශේෂය අයකර ගැනීම සඳහා සමාගම හිතකර ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2018 වර්ෂයේදී එම මුදලින් යම් ප්‍රමාණයක් අය කර ගැනීමට සමාගමට හැකි වූ අතර අයකර ගැනීමේ ක්‍රියාවලිය දැනටමත් සිදුවෙමින් පවතී. | හිඟ මුදල් අය කර ගැනීමට සමාගම වහාම පියවර ගත යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | | | |
| (i) මාර්ගෝපදේශ අංක 4.2.2 | මූල්‍ය හා භෞතික වශයෙන් වූ මාසික කාර්ය සාධන ප්‍රකාශ, මෙහෙයුම් ප්‍රකාශ, මුදල් ප්‍රවාහ ප්‍රකාශ, ද්‍රවශීලතා ප්‍රකාශ, ණය ගැනීම් සහ සේවක තනතුරු, නව බඳවා ගැනීම් ඇතුළුව මානව සම්පත් පිළිබඳ ප්‍රකාශ සෑම මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදීම සභාගත කර නොතිබුණි. | 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 හි අංක 4.2.2 වගන්තියේ සඳහන් මාසික මූල්‍ය ප්‍රකාශන මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරනු ලබන ඕනෑම ඉදිරිපත් කිරීමක් සනාථ කිරීම සඳහා සියලු සාක්ෂි තබා ගත යුතු වේ. |
| (ii) මාර්ගෝපදේශ අංක 4.3 | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා රැස්වීමෙන් දින 10 ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා හට යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා 2019 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (iii) මාර්ගෝපදේශ අංක 5.1.1 | සමාගම වසර 3 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු අතර වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන සැලැස්මේ පිටපත් යාවත්කාලීන වාර්ෂික අයවැය සමඟ මූල්‍ය වර්ෂයේ ආරම්භයට දින 15 කට පෙර රේඛීය | 2019 වර්ෂය සඳහා වන එකී වාර්තා 2019 නොවැම්බර් 23 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර 2019 ජනවාරි 17 වන දින රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම එම අවශ්‍යතාවයට අනුකූල ව කටයුතු කර නොතිබුණි. | යොමු කරන ලදී. | |
| (iv) | මාර්ගෝපදේශ අංක 5.2.1 | ක්‍රියාකාරී සැලැස්ම සමඟ අයවැයගත ප්‍රාග්ධන වියදම් අයවැයට ඇතුළත් විය යුතුය. කෙසේ වෙතත්, එවැනි ක්‍රියාකාරී සැලැස්මක් සමාගම විසින් 2018 වර්ෂය සඳහා සකස් කර නොමැත. | ක්‍රියාකාරී සැලැස්ම 2018 අයවැයට ඇතුළත් කර නොතිබුණද, 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති අතර එය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | සමාගම මාර්ගෝපදේශ යේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (v) | මාර්ගෝපදේශ අංක 5.2.2 (ආ) | රුපියල් මිලියන 10 ඉක්මවූ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගත යුතුය. කෙසේ වෙතත්, සමාගම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය යටතේ නිර්දේශිත ප්‍රාග්ධන වියදම් ඇතුළු ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අප විසින් පිළිපදිනු ලැබේ. මේ අනුව, මෙම කාණ්ඩය යටතේ ප්‍රාග්ධන වියදම් සඳහා වන අනුමැතිය අදාළ කමිටුවෙන් සුදුසු පරිදි ලබාගෙන ඇත. | සමාගම මාර්ගෝපදේශ යේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (vi) | මාර්ගෝපදේශ අංක 9.2 | අනුමත කාර්ය මණ්ඩලයක් සහිතව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ සංවිධාන ව්‍යුහයක් සමාගම සතුව නොමැත. | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සමාගමේ වාර්ෂික අයවැයට සියලු නව කාර්ය මණ්ඩල වියදම්/ අයවැය | සමාගම මාර්ගෝපදේශ යේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන ඇතුළත් කර ඇති බැවින් කාර්ය මණ්ඩලය සඳහා අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමේ පිළිවෙතක් මානව සම්පත් සම්බන්ධයෙන් නොමැත. | |
| (vii) | මාර්ගෝපදේශ අංක 9.3 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත අමාත්‍යාංශය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටියක් සමාගම සතුව නොමැත. | සියළුම කාර්ය මණ්ඩල උසස්වීම් කාර්ය සාධන කළමනාකරණ යෝජනා ක්‍රමය මත පදනම්ව රේඛීය අධීක්ෂකවරුන් / ක්‍රියාකාරී ප්‍රධානීන් විසින් නිර්දේශ කර ඇති අතර කළමනාකරණ අධ්‍යක්ෂ විසින් අනුමත කර ඇත. මානව සම්පත් සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමේ පිළිවෙතක් සමාගම සතුව නොමැත. කෙසේ වුවද, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව එවැනි සියලු වියදම් / අයවැය ප්‍රතිපාදන සමාගමේ වාර්ෂික අයවැයට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඇතුළත් කර ඇත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (viii) | මාර්ගෝපදේශ අංක 9.7 | වැටුප් හා දීමනා අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටිය මත පදනම් විය යුතු අතර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව සංශෝධනයකට ඉඩ නොදේ. කෙසේ වෙතත්, සමාගම අවශ්‍යතාවයට අනුකූල වී නොමැත. | සියලුම කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා යෝජනා ක්‍රම සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබේ. මානව සම්පත් සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමේ පිළිවෙතක් | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සමාගම සතුව නොමැත. කෙසේ වුවද, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව එවැනි සියලු වියදම් / අයවැය ප්‍රතිපාදන සමාගමේ වාර්ෂික අයවැයට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඇතුළත් කර ඇත. | |
| (ආ) 2011 සැප්තැම්බර් 01 දිනැති අංක පීඊඩී 58 (2) දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ ඇති ආයතන වර්ගීකරණයන්ට අනුව ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම “එෆ්” කාණ්ඩයට අදාළ බව පෙනී යයි. ඒ අනුව මෙම උප කාණ්ඩය යටතේ ගැනෙන රජයේ ව්‍යාපාරවල ප්‍රධාන විධායක නිලධාරීන්ට දීමනා ගෙවීම සහ නියමයන් සහ කොන්දේසි අදාළ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඊට සමාන ආයතනයන් භාවිතා කරනු ලබන තරඟකාරී වෙළඳපල අනුපාත සහ අදාළ පුද්ගලයාගේ අධ්‍යාපන හා නිපුණතා මට්ටම සලකා බැලීමෙන් අනතුරුව ගරු. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ එකඟතාවය මත තීරණය කරනු ලැබේ.<br>කෙසේ වුවද, වැටුප් තීරණය කිරීම සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ එකඟතාවය සමාගම විසින් ලබා ගෙන ඇති බව තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය. | සියලුම කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා යෝජනා ක්‍රම සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබේ. මානව සම්පත් සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමේ පිළිවෙතක් සමාගම සතුව නොමැත. කෙසේ වුවද, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව එවැනි සියලු වියදම් / අයවැය ප්‍රතිපාදන සමාගමේ වාර්ෂික අයවැයට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඇතුළත් කර ඇත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනත | | | |
| (i) 41 (I) වගන්තිය | ඉකුත් විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති නමුත් විගණන හා කළමනාකරණ කමිටුව සමාගම විසින් මේ දක්වා ස්ථාපිත කර නොමැත. | නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූලව අප විසින් කටයුතු කර ඇති අතර 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 හි 7.4.1 වගන්තිය ප්‍රකාරව ලිට්රෝ ගෑස් ලංකා සමාගම සඳහා විගණන කමිටුවක් පිහිටුවීමට නිසි පියවර ගෙන තිබුණි. | සමාගම මාර්ගෝපදේශ යේ සහ භාණ්ඩාගාර චක්‍රලේඛවල විධිවිධාන පිළිපැදිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 391,443,422 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 260,391,456 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 131,051,966 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාගමේ විකුණුම් ආදායම සියයට 28 කින් සහ ආයෝජකයාගේ ලාභ කොටස සියයට 1694 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

විගණනයට ලද තොරතුරුවලට අනුව 2018 වර්ෂය සහ ඊට පෙර වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත පහත පරිදි වේ.

| | **2018** | **2017** |
|---|---|---|
| **ලාභදායිතා අනුපාත (ප්‍රතිශත)** | | |
| දළ ලාභ අනුපාතය | 6.38 | 4.00 |
| ශුද්ධ ලාභ අනුපාතය | 1.01 | 0.86 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 1.53 | 1.05 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය | 2.39 | 1.96 |
| **ද්‍රවශීලතා අනුපාත (වාර ගණන)** | | |
| ජංගම වත්කම් අනුපාතය | 3.51 | 3.1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 3.14 | 2.70 |

සමාගමේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 2.38 සහ සියයට 0.15 කින් ඉහළ ගොස් ඇත. තවද, පෙර වර්ෂයට සාපේක්ෂව වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය සියයට 0.48 කින් සහ සියයට 0.43 කින් වැඩි

වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් විකුණුම් ආදායම වැඩිවීම බලපා ඇත. ජංගම වත්කම් සහ ක්ෂණික වත්කම් අනුපාතයන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව 0.4 කින් අඩු වී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2015 සිට 2018 දක්වා කාලය ඇතුළත සමාගම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් පුද්ගලයින් සඳහා දීමනා ලෙස රු. මිලියන 52.42 ක මුදලක් දරා ඇත. ඊට ව්‍යාපාර සංවර්ධන සම්බන්ධීකාරකවරුන් 38 ක්, ව්‍යාපාර විශ්ලේෂකයින් 03 ක්, උපදේශකයින් 03 ක් සහ අමාත්‍යාංශ සම්බන්ධීකාරකවරුන් 08 දෙනෙක් ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | ව්‍යාපාර සම්බන්ධීකාරකවරුන් සමාගමට සේවයක් ලබා දී ඇති අතර විගණනයේදී වැඩ පිළිබඳ සාක්ෂි විගණන නිලධාරීන්ට ලබා දී ඇත. | |

| | | | |
|---|---|---|---|
| (i) | ඉහත බඳවා ගැනීම් සඳහා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී / 12 හි 9.10 ප්‍රකාරව සමාගම භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොමැති අතර, ඉහත බඳවා ගැනීම් 10 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ද අනුමැතිය ලබාගෙන නොමැත. ඉහත නිරීක්ෂණවලට ප්‍රතිචාර වශයෙන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ වරයා පහත ප්‍රකාශ සිදු කරන ලදී. “ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය යනු ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ එදිනෙදා කටයුතු සිදු කිරීමට අවශ්‍ය භාණ්ඩාගාර ලේකම්ගේ නියෝජිත බලය ක්‍රියාත්මක කිරිම සඳහා ඔහු විසින් නම් කළ පුද්ගලයන් වේ.” එසේම “දැනට ක්‍රියාත්මක වන ක්‍රියා පටිපාටිය තුළ සියලුම සේවා කොන්ත්‍රාත්තු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් නොකරන බව සඳහන් කළ යුතුය”. | අදහස් දක්වා නොමැත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (ii) | ඉහත තනතුරු සඳහා මෙම පුද්ගලයින් තෝරා ගැනීමේදී නිසි බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියක් හා පදනමක් අනුගමනය කර නොතිබුණි. ව්‍යාපාර සංවර්ධන සම්බන්ධීකාරක ලෙස වැඩ කිරීමේ හැකියාව පරීක්ෂා කිරිම සඳහා අවම වශයෙන් මූලික සුදුසුකම් සහ අත්දැකීම් ඇගයීමට ලක් කර නොමැත. සමහර පුද්ගලයින් අදාළ | ඉහත සඳහන් පුද්ගලයින් සමාගමේ සේවකයින් නොවන බව පැවසිය යුතු අතර ඔවුන් ස්වාධීන කොන්ත්‍රාත්කරුවන් වූ අතර ඔවුන්ට කොන්ත්‍රාත්තුවේ හඳුනාගෙන ඇති පරිදි විශේෂිත කාර්යයන් සඳහා සහ ඔවුන්ගේ කොන්ත්‍රාත්තු වල දක්වා ඇති නිශ්චිත කාල සීමාවක් සඳහා ගෙවනු ලැබීය. එබැවින් 1.9 (ආ) අනුව ඔබේ නිරීක්ෂණය පැන නගින්නේ නැත. කෙසේ වුවද, විශේෂිත කාර්යයන් යන්නට සමූහයක් අතර | අදාළ බලධාරීන්ගේ අනුමැතිය ඇතිව නිසි බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියක් සහ පදනමක් මත බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද ලබා දී නොමැති අතර සමහරු බඳවාගෙන ඇත්තේ එවකට මුදල් අමාත්‍යවරයාගේ ඉල්ලීම මත පමණි. | දෘශ්‍යතාව, පොදු ස්ථානවලට ගොස් පත්‍රිකා බෙදා හැරීම ට ඇති කැමැත්ත, දත්ත එක්රැස් කිරීම සහ ඊට අනුබද්ධ හෝ ඒ හා සම්බන්ධ ඕනෑම ක්‍රියාවක් සිදුකිරීමට අවශ්‍ය වන ප්‍රායෝගික ස්වභාවයක් ගන්නා කාර්යයන් අයත් වේ. ගිවිසුම් වල 3 වන ඡේදයේ දැක්වෙන පරිදි මෙම පුද්ගලයින් ස්වාධීන සේවකයින් වන අතර ඔවුන් ලිට්රෝ ගෑස් ලංකා සමාගමෙහි සේවකයෙකු, හවුල්කරුවෙකු, නියෝජිතයෙකු හෝ හවුල් ව්‍යාපාරයක් නොවේ. | |
| (iii) | සමහර පත්වීම්ලාභීන්ගේ වැඩවල විෂය පථය සමාගම විසින් පැහැදිලිව හා අර්ථ දක්වා නොමැත. | 2015 ජනවාරි සිට 2015 සැප්තැම්බර් දක්වා කාලය තුළ මුදල් අමාත්‍යාංශය රේඛීය අමාත්‍යාංශය වූ අතර වර්තමාන සේවා ස්ථානය ලෙස මුදල් අමාත්‍යාංශයට වාර්තා කිරීම සඳහා විශ්ලේෂකයන් නිදහස් කිරීම අමාත්‍යාංශයේ නියෝගය විය. ඔවුන් ලිට්රෝ ගෑස් ලංකා සමාගමෙහි ව්‍යාපාර සංවර්ධනයට සහ ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කිරීමට අදාළ ව රේඛීය අමාත්‍යාංශය සමඟ සමීපව කටයුතු කළ බව අපගේ විශ්වාසය හා අවබෝධයයි. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. (2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී / 12 හි 9.4) |
| (iv) | සේවා කොන්ත්‍රාත්තුවක් මගින් ව්‍යාපාර සංවර්ධන සම්බන්ධීකාරකවරුන්ට වැඩ පවරා තිබුණද, පිළිගත හැකි වැඩ පිළිබඳ වාර්තා සමාගමට ඉදිරිපත් කර නොතිබූ අතර ඔවුනට ගෙවීම් කිරීමට පෙර නිසි ඇගයීමක් සිදු කර නොමැත. | අප පිවිස ඇත්තේ සේවා කොන්ත්‍රාත්තු වලට නොවන අතර ඒවා ඉටු කරනු ලබන සේවාවන් සඳහා “ස්වාධීන කොන්ත්‍රාත්තු” බව කරුණාවෙන් සලකන්න. වැඩ පිළිබඳ වාර්තා සමාලෝචනය කර ඇති අතර වාර්තා ලැබීමෙන් පසු ගෙවීම් කර ඇත. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගෙන තිබේද යන්න සහතික කිරීම සඳහා සමාගම ප්‍රමාණවත් සාක්ෂි තබා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (v) සමාගම විසින් උපදේශකයින් 03 දෙනෙකු පත් කර ඇතත් පත්වීම් ලැබීමට පෙර අවශ්‍යතා පිළිබඳ නිසි ඇගයීමක් සිදු කර නොමැත. තවද, ඔවුන් වාර්තා කර ඇත්තේ අමාත්‍යාංශයට වේ. | අදහස් දක්වා නොමැත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (vi) සමාගමේ නව ව්‍යාපෘති සහ ව්‍යාප්ති සැලසුම් සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය සහ සමාගම සම්බන්ධීකරණය කිරීම සඳහා අමාත්‍යාංශ සම්බන්ධීකාරකවරුන් අට දෙනෙකු පත් කර තිබුණු අතර නඩත්තු වියදම් ලෙස රු. මිලියන 1.5 කට අධික වියදමක් දරමින් වාහන හතරක් ඔවුන්ට පවරා ඇත. කෙසේ වුවද, එම සම්බන්ධීකරණය කරන ලද ව්‍යාපෘති පිළිබඳ තොරතුරු විගණනයට ලැබී නොමැත. | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් පැමිණීම තහවුරු කිරීම මත මෙම සම්බන්ධීකාරකවරුන්ට මුදල් ගෙවන ලදී. එම කරන ලද වැඩ පිළිබඳ විස්තර අමාත්‍යාංශයේ තිබිය යුතුය. | සමාගම සිය රාජකාරිය ඉටු නොකළ නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු අතර ඔවුන්ට ගෙවන ලද මුදල ආපසු අය කර ගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 සිට 2018 දක්වා පුරාවිද්‍යාව පිළිබඳ පර්යේෂණ හා පුණ්‍ය කටයුතු සඳහා මූල්‍ය ආධාර සැපයීම වෙනුවෙන් සමාගම ප්‍රවාහන දීමනාවක් ලබා දී තිබුණි. ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් ලෙස එකම ක්‍රියාකාරකමක් සඳහා සමාගම එක් පාර්ශවයකට ගෙවීම් කර ඇත. තවද, අදාළ පාර්ශවයේ ක්‍රියාකාරකම් වාර්තාව ඉල්ලීමට අනුකූල නොවන බව නිරීක්ෂණය විය. | එම ඉල්ලීමට අනුව, ඔහු රට පුරා සංචාරය කළ යුතු බැවින්, ඔහුගේ ගමන් වියදම් සඳහා මාසිකව ආධාර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී. | අපේක්ෂිත භාවිතය සඳහා අරමුදල් භාවිතා කර ඇත්දැයි සමාගම සහතික කළ යුතු අතර ගෙවීම් කිරීමට පෙර අදාළ අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම සඳහා ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ පෙර පරිපාලන සමාගම වන කළම්බු ගෑස් කම්පැනි ලිමිටඩ් විසින් 1986 වර්ෂයේ දී රු. මිලියන 13 ක මිලකට ඔරුගොඩවත්ත නමින් ඉඩමක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, ලිට්රෝ ගෑස් ලංකා සමාගම නමට ඉඩම් ඔප්පුව පවරා නොතිබූ අතර තවද, මිලදී ගත් දින සිට සමාගම විසින් එම ඉඩම භාවිතා කර නොමැත. | අදහස් දක්වා නොමැත. | ඉඩමේ හිමිකම සමාගමට පැවරීමට වහාම පියවර ගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය නොකර, සමාගම 2015 දී සිලින්ඩර (කි.ග්‍රෑ.12.5)5,996 ක් පෞද්ගලික පාර්ශවයකින් රු. 18,233,819 කට මිලදී ගෙන ඇති අතර එම සිලින්ඩර් තවමත් නිෂ්කාර්ය ව පවතී. තවද, ටෙන්ඩර් පටිපාටිය සම්බන්ධයෙන් පැන නගින අක්‍රමිකතා කිහිපයක් පිළිබඳ පරීක්ෂණයක් අවසන් වන තුරු වෙළඳපොළට සිලින්ඩර නිකුත් නොකරන ලෙස රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය ඉල්ලා ඇති බව නිරීක්ෂණය විය. | සමාගමේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව මෙම ටෙන්ඩරය 2016 දී සිදු කරන ලද අතර එම සිලින්ඩර් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් අනුමත නොකිරීම හේතුවෙන් මෙම ටෙන්ඩරය අවසන් විය. දැනට අංගනයෙහි පවතින සිලින්ඩර් වෙළඳපොලට මුදා හැරීම සඳහා ආරක්ෂක ප්‍රමිතීන්ට අදාළ වන පරිදි නවීකරණය කරමින් පවතී. රේඛීය අමාත්‍යාංශය වන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම ටෙන්ඩරය පිළිබඳ ව කරනු ලබන විමර්ශනයක් මෙම ප්‍රමාදයට හේතු වී ඇත. මේ සඳහා ගිණුම්වල ප්‍රතිපාදනයක් සලසා ඇත. | මෙම ගැටළුව විසඳීම සඳහා වහාම පියවර ගත යුතුය. |